# කොළඹ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2012

08 වන ශ්‍රේණිය | භූගෝල විද්‍යාව - I | කාලය : පැය 1/2 යි

නම/ විභාග අංකය : ............................................ පාසල : ..........................................

උපදෙස් :
- I කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටසට ලකුණු 40 ක් හිමි වේ.

## I කොටස

- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය පෘථිවි දින
(1) 336 යි (2) 365 1/4 යි (3) 365 යි (4) 364 යි

02. දිවා කාලයේ දී ඊයම් උණු කිරීමට තරම් උෂ්ණත්වයකුත්, රාත්‍රී කාලයේ දී ඔක්සිජන් ද්‍රව බවට පත්කිරීමට තරම් සිසිල් බවකුත් පවතින ග්‍රහලෝකය වන්නේ,
(1) අඟහරු (2) බුධය (3) සෙනසුරු (4) නෙප්චූන්

03. පෘථිවි පරිභ්‍රමණයේ ප්‍රතිඵලයකි.
(1) දිවා රාත්‍රී ඇති වීම (2) වේලාවේ වෙනසක්ම ඇති වීම
(3) ඍතු භේදය ඇති වීම (4) නැගෙනහිර දේශාංශවලට කලින්ම හිරු උදාවීම

04. නැගෙනහිර දේශාංශ $80^0$ පිහිටි කොළඹ නගරයේ වේලාව දහවල් 12.00 නම් බටහිර දේශාංශ $20^0$ පිහිටි රටක වේලාව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පෙ.ව. 6.20 (2) ප. ව. 5.20 යි (3) පෙ.ව. 5.00 යි (4) පෙ.ව. 5.20 යි

05 දකුණු ආසියාතික රටවල් අතරින් සාගර සම්පතින් පොහොසත්ම රට
(1) ඉන්දියාව (2) ශ්‍රී ලංකාව (3) මාලදිවයින (4) පකිස්ථානය

- අංක 06 සිට 10 දක්වා ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් වැරදි (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

06. ලෝකයේ අධික වර්ෂාපතනයක් ලැබෙන ඇසමයේ චෙරාපුන්ජි වැනි ප්‍රදේශ මෙන්ම, අධික උෂ්ණත්වයක් ඇති ථාර් වැනි කාන්තාර ප්‍රදේශ ද ඉන්දියාවේ ඇත. ( )
07. වැඩිම උපග්‍රහයන් සංඛ්‍යාවක් ඇති ග්‍රහ ලෝකය සෙනසුරුයි. ( )
08. ශිලා ගෝලය භූ තැටි 05 කින් සමන්විත වේ. ( )
09. ගවයාගෙන් ලබාගන්නා ගොම, පිදුරු සමග මිශ්‍රකොට වියලා බලශක්තියක් ලෙස යොදා ගැනීමට ඉන්දීය ජනයා ප්‍රිය කරති. ( )
10. දකුණු ආසියානු කලාපයේ නිතර ජල ගැලීම්වලට ලක්වන රටක් මාලදිවයින. ( )

♦ අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති ලෝක සිතියම උපකාරී කරගන්න.




11. A අක්ෂරයෙන් ආසියානු කලාපයේ උතුරු සීමාව ..............................................................................

12. B වලින් දක්වා ඇත්තේ ..............................................................................

13. C වලින් දක්වා ඇත්තේ ආසියානු කලාපයේ සංවර්ධිත රටක් වන ..............................................

14. D වලින් දක්වා ඇති ගංගාව ..............................................................................

15. E වලින් දක්වා ඇති දූපත ..............................................................................

♦ 16. - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.

16. දකුණු ආසියානු කලාපයේ විශාලතම රට ................................................ ය.

17. මාලදිවයිනේ වැසියන්ගේ වැඩි වශයෙන් වාසය සඳහා ඇති ප්‍රධාන දූපත වන ................................................ සංචාරකයෝ සඳහා තහනම් කලාපයක් කර ඇත.

18. භූතානය හා නේපාලය යන රටවල් ................................................ සම්පත් නොමැති රටවල් දෙකකි.

19. බංගලාදේශය අයත් තැනිතලාවකි ................................................

20. නේපාලයේ උසම කඳු මුදුන ................................................

# කොළඹ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2012

08 වන ශ්‍රේණිය | භූගෝල විද්‍යාව - II | කාලය : පැය 1, 1/2 යි

නම/ විභාග අංකය : ............................................................. පාසල : ..............................................

උපදෙස් :

- පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න.

01. (1) දකුණු ආසියානු රටවල ජීවත්වන මිනිසුන් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා දෙවන වාරයේ පාසල් පාදක ඇගයීම වශයෙන් ඔබේ ගුරුතුමා / ගුරුතුමිය ඔබට කිරීමට උපදෙස් දුන් ඇගයීම නම් කරන්න. (ලකුණු 04)

(2) තොරතුරු එක් රැස් කිරීම සඳහා ඔබ යොදා ගත් විවිධ මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) දකුණු ආසියාතික රටවල තොරතුරු ඉදිරිපත් කිරීමට ඔබ යොදාගත් මාතෘකා දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) ඔබ එම තොරතුරු වඩාත් ආකර්ශණීය ලෙස ඉදිරිපත් කිරීමට යොදාගත් ක්‍රම වේදයන් හතරක් ලියන්න. (ලකුණු 04)

(5) මෙම ක්‍රියාකාරකම කිරීමෙන් ඔබ ලබාගත් ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

02 . (1) සෞරග්‍රහ මණ්ඩලයට අයත් විශාලම ග්‍රහලෝක හා කුඩාම ග්‍රහලෝක සඳහන් කරන්න. (ලකුණු 02)

(2) සෞරග්‍රහ මණ්ඩලය හා සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

A - සූර්යයා වෙත ග්‍රහලෝක ඇද ගැනීමේ බලය

B - නැගෙනහිර සිට බටහිරට භ්‍රමණය වන ග්‍රහලෝකය

C - පෘථිවි අක්ෂයේ ආනතිය අංශක කීයද?

D - දේශාංශ $360^0$ ක් භ්‍රමණය වීමට ගතවන කාලය (ලකුණු 04)

(3) විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා වර්තමානයේ දී වායු ගෝලය අපිරිසිදු වී ඇත. වාතය අපිරිසිදු කරන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කර විස්තර කරන්න. (ලකුණු 05)

03. (1) දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම පිළිබඳ පහත සඳහන් හිස්තැන් පුරවන්න.

A - උතුරින් -

B - දකුණින් -

C - බටහිරින් -

D - නැගෙනහිරින් - (ලකුණු 02)

(2) පහත සඳහන් දකුණු ආසියානු රටවල අගනුවරවල් පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 04)

A - ඉන්දියාව

B - පකිස්ථානය

C - නේපාලය

D - බංගලාදේශය

(3) දකුණු ආසියානු කලාපයේ දේශගුණික විවිධත්වය ඇති වීමට බල පෑ හේතු දෙකක් සඳහන් කර විස්තර කරන්න. (ලකුණු 05)

04. (1) ඉන්දියානුවන් බලශක්තිය නිපදවා ගන්නා ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) ඉන්දියාවේ යපස් කර්මාන්තය නිසා එහි ජන ජීවිතයට ඇති වන අහිතකර බලපෑම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) බංගලාදේශයේ හණ කර්මාන්තය තුළින් ජන ජීවිතයට කරන හිතකර බලපෑම් 02 ක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

05 . (1) දකුණු ආසියාතික රටක් ලෙස ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) මාලදිවයිනේ දූපත් සංචාරක කර්මාන්තය සඳහා යෝග්‍ය වීමට ප්‍රධාන හේතු 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) පකිස්ථානය ස්වාභාවික සම්පත් අඩු රටකි. නමුත් එරට ග්‍රාමීය කර්මාන්ත වැඩි දියුණු වීම රටේ සංවර්ධනයට බලපාන ආකාරය කරුණු කදෙකක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 05)

06. (1) හිමාලයේ කඳුවැටියේ උසම කඳු මුදුන වන එවරස්ට් තරණය කළ ප්‍රථම ලෝක ප්‍රසිද්ධ පුද්ගලයා නම් කරන්න. (ලකුණු 02)

(2) පහතින් දක්වා ඇති හිමාලය කඳු කර ප්‍රදේශවල ජීවත් වූ ජන කාණ්ඩය නම් කරන්න. (ලකුණු 04)

- (1) ඉන්දියාවේ හිමචාල් ප්‍රදේශය
- (2) ලඩාක් ප්‍රදේශය
- (3) හිමාලයානු ප්‍රදේශය
- (4) සෝලෝකුම්බු ප්‍රදේශය

(3) කඳුකර ගෝත්‍රික ජනයන්ගේ ජීවිතය හා සම්බන්ධව පවතින ගැටළු දෙකක් දක්වා විස්තර කරන්න.

07. දී ඇති ලෝක සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | |
|---|---|
| (1) ඩෙකැන් සානුව | (2) බෙංගාල බොක්ක |
| (3) සුමාත්‍රා දූපත් | (4) ඇෆ්ගනිස්ථානය |
| (5) දිල්ලිය | (6) අරාබි මුහුද |
| (7) නේපාලය | (8) චීනය |
| (9) පර්සියන් බොක්ක | (10) රතු මුහුද |
| (11) මාලදිවයින | |

(ලකුණු 11)